C
370.7
DHA

# ශ්‍රී ලංකාවේ ගුරු පුහුණුව ප්‍රතිසංවිධානය කළ යුතු ආකාරය (මහනුවර දිස්ත්‍රික්කයේ ගුරු විද්‍යාල තුනක් ඇසුරින් කරන අධ්‍යයනයක්)

# REORGANISING TEACHER TRAINING IN SRI LANKA (A STUDY BASED ON THREE TEACHER TRAINING COLLEGES IN KANDY DISTRICT)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනය
1998

**ඩී.එම්.අයි.එස්. ධර්මදාස**
**සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය,**
**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට)**
**ශාස්ත්‍රපති (සිංහල)**

515417

පර්යේෂණ උපදේශක
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී, ආචාර්ය සිල්වි සේනාධීර මහත්මිය

SITY OF PERADENIYA
15-5-1999
LIBRARY

**ABSTRACT**

This research study on reorganising teacher training in Sri Lanka is based on a random sample of 360 pupil teachers, who belong to 1995/1996 academic years in three teacher training colleges in the Kandy District.

The dissertation consists of seven chapters. The first chapter deals with an introduction of the need for the research and its importance.

The second and third chapters deal with clarification of concepts and the background of literature relevant to teacher training, respectively.

Research objectives, population, sample, the nature of questionnaires given to pupil teachers and lecturers and the procedure of obtaining responses are described in the fourth chapter.

In the fifth chapter, the responses gathered from the questionnaires and the ideas expressed by the educationists, at the interviews are analysed.

The sixth chapter reveals the following findings: Implementing a preservice training, providing facilities for pupil teachers for learning extra curricular activities, proper guidance and facilities given to them during the teaching practice, changing teaching and evaluating techniques, making innovations of curriculum to suit the social and technical developments and

implementing continuous teacher training as a means of professional development.

The seventh chapter outlines proposals under four main themes.

1. A fulltime preservice course for newly appointed teachers and improving sport and aesthetic competencies of pupil teachers are proposed for reorganising teacher training.

2. For a successful teaching practice, the importance of effective supervision, gaining assistance from schools, and conducting harmonious team teaching instead of competitive teaching practice are suggested.

3. For changing teaching and evaluating techniques, following proposals are outlined. Providing wider opportunities for pupil teachers for improving investigating abilities, organising seminars and workshops effectively and implementing continuous assessments through out the course.

4. Under the innovations of curriculum, improving English and Tamil language skills of pupil teachers, giving opportunities for learning Agriculture, taking steps for improving moral development of pupil teachers through teacher training and giving them abilities of using new technical instruments are proposed.

This chapter finally proposes the importance of giving incentives for both pupil teachers and lecturers for improving the quality of teacher training.

It is appreciated if the proposals outlined here are implemented at least in one training college in order to create an effective teacher training in Sri Lanka.

# පර්යේෂණ සාරාංශය

ශ්‍රී ලංකාවේ ගුරු පුහුණුව ප්‍රතිසංවිධානය කළයුතු ආකාරය පිළිබඳව මහනුවර දිස්ත්‍රික්කයේ ගුරු විද්‍යාල තුනක්වන, පේරාදෙණියේ ඉංග්‍රීසි ගුරු විද්‍යාලය, ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලය සහ ගම්පොල කාන්තා ගුරු විද්‍යාලය යන ගුරු විද්‍යාලවල 1995/96 අධ්‍යයන වර්ෂ තුළ පුහුණුව ලැබූ ගුරුශිෂ්‍ය ශිෂ්‍යාවන් 360 ක නියැදියක් ඇසුරෙන් කරන ලද, මෙම පර්යේෂණ නිබන්ධනය, පරිච්ඡේද හතකින් සමන්විත වේ.

පර්යේෂණ අවශ්‍යතාව සහ වැදගත්කම පිළිබඳව පළමු පරිච්ඡේදයෙන් ද, සංකල්ප පැහැදිලි කිරිම දෙවන පරිච්ඡේදයෙන් ද, ගුරු පුහුණුවට අදාළ විදේශීය හා දේශීය පෙර සාහිත්‍ය පසුබිම තුන්වන පරිච්ඡේදයෙන් ද ඉදිරිපත් කරන ලදී.

පර්යේෂණ අරමුණු, පර්යේෂණ ජනගහනය, නියැදිය ගුරුශිෂ්‍ය, කථිකාචාර්ය සහ ගුරුවිදුහල්පතිවරුන් සඳහා සපයන ලද ප්‍රශ්නාවලි සහ ප්‍රතිචාර ලබා ගත් ආකාරය පිළිබඳව අවබෝධයක් හතරවන පරිච්ඡේදය තුළින් ලබා ගත හැක.

පස්වන පරිච්ඡේදයේදී, ගුරුසිසුන් සහ කථිකාචාර්යවරුන්ගේ ප්‍රශ්නාවලින්ට ලැබුණු දත්ත ප්‍රමාණාත්මකව ප්‍රතිශත ඇසුරින් ද, විවෘත ප්‍රතිචාර සහ සම්මුඛ සාකච්ඡාවේදී අධ්‍යාපනඥයින් ප්‍රකාශ කළ අදහස් තුලනාත්මකව ද විශ්ලේෂණය කරන ලදී. මෙම විශ්ලේෂණයන්ට අනුව, ගුරු විද්‍යාලවල වර්තමානයේ ක්‍රියාත්මකවන පුහුණු පාඨමාලාවන්හි පවත්නා දුර්වලතාවන්ගේ යථා ස්වභාවය ද, ඒවා සම්බන්ධයෙන් අනුගමනය කළයුතු පිළියම් පිළිබඳව ද කරුණු හෙළි කර ගැනීමට හැකි විය.

හයවන පරිච්ඡේදයේදී පහත සඳහන් නිගමනවලට එළඹීමට හැකි විය. පූර්ව සේවා ගුරු පුහුණුව ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම, ගුරුසිසුන්ට සමගාමී විෂයයන් ඉගෙනීමට ප්‍රමාණවත් පහසුකම් ලබාදීම, ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට

ගුරුසිසුන්ට අවශ්‍ය මගපෙන්වීම, ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම විවිධාංගීකරණය කිරීම, ගුරු පුහුණුවට අදාළ විෂයමාලාව සමාජ හා තාක්ෂණ දියුණුවට අනුව නවීකරණය කිරීම, වෘත්තීය සහ කාලීන අවශ්‍යතා අනුව ගුරුවරුන් පුහුණු කිරීම සුදුසු බව අනාවරණය විය.

හත්වන පරිච්ඡේදයේ දී ප්‍රධාන කරුණු හතරක් මුල් කර ගෙන යෝජනා ඉදිරිපත් කරන ලදී.

වර්තමාන ගුරු පුහුණුව ප්‍රතිසංවිධානය කළයුතු ආකාරය පිළිබඳව ඉදිරිපත් කළ යෝජනා අතර, නවක ගුරුවරුන්ට ප්‍රාථමික, කනිෂ්ඨ, ද්විතීයික වශයෙන් පාසල් පද්ධතියට ප්‍රයෝජනවත්වන පරිදි පූර්ණකාලීන පූර්ව සේවා පුහුණුවක් ලබාදීම සහ පුහුණු කාලය තුළ ක්‍රීඩා, සෞන්දර්ය වැනි සමගාමී විෂයයන් පිළිබඳ නිපුණතාවන් ලබාදීම කාලීන වශයෙන් වැදගත් බව යෝජනාවලදී සඳහන් විය.

ප්‍රයෝගික ඉගැන්වීම් පුහුණුවේ සාර්ථකත්වය සඳහා විධිමත් අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම, පුහුණු කාලසීමාව තුළ අදාළ පාසල්වල විදුහල්පති සහ ගුරුමණ්ඩලයෙන් සහායක් ලබා ගැනීම සහ තරඟකාරීත්වයෙන් තොරව සාමූහිකව කණ්ඩායමක් වශයෙන් ගුරු පුහුණුව ආශ්‍රිතව කටයුතු කිරීමේ වැදගත්කම ආදිය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී.

පුහුණු පාඨමාලාව තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම ගුරුසිසුන්ගේ ක්‍රියාකාරි චින්තන හැකියා සහ විභව ශක්තීන් දියුණු කිරීමට බාධාවක් බව අනාවරණය වූ නිසා ස්වයං ඉගෙනීමේ අවස්ථා පුළුල් කිරීම, සම්මන්ත්‍රණ සාකච්ඡා, වැඩමුළු අර්ථවත්ව සංවිධානය කිරීම සහ ගුරු පුහුණු පාඨමාලාවට අයත් සෑම ක්ෂෙත්‍රයක්ම අඛණ්ඩව ඇගයීම යෝග්‍ය බව යෝජනා වලින් පැහැදිලි කෙරුණි.

ගුරු පුහුණුවට අදාළ විෂයමාලාව ප්‍රතිසංවිධානය කිරීමේදී ඉංග්‍රීසි සහ ද්‍රවිඩ භාෂා හැකියා දියුණු කිරීම ගුරුසිසුන්ට ප්‍රයෝජනවත් වන නිසා දෙමළ භාෂාව කඩිනමින් ඉගැන්වීමටත්, ගුරු පුහුණුව සඳහා ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය කිරීමටත්, සුදුසු බව යෝජනා කරන ලදී.

කෘෂිකර්මය විෂය ඉගෙනීමට සෑම ගුරුශිෂ්‍යයෙකුටම අවස්ථාව ලබාදීම, යහපත් පාසල් සමාජයක් ගොඩ නැංවීම සඳහා පුහුණුව තුළින් සදාචාරවත් ගුරුපිරිසක් බිහි කර ගැනීම සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳව ගුරුසිසුන් දැනුවත් කිරීමට ද අවශ්‍ය බව පෙන්වා දෙන ලදී.

පාසල් විෂයමාලාවේ නවීකරණ අවශ්‍යතා අනුව, ගුරු පුහුණුව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ගුරු පුහුණුවේ ගුණාත්මක තත්ත්වය නංවාලීමට කථිකාචාර්යවරුන් සහ ගුරුසිසුන් දිරිගැන්වීම සඳහා දේශීය සහ විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම යෝග්‍ය බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

සමීක්ෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව, ඉහත දැක්වූ යෝජනා එක් ගුරු විද්‍යාලයක හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේ නම්, එය අනාගත ගුරු අධ්‍යාපනයේ ප්‍රගතියට හේතුවක් වන බව සඳහන් කළ හැකිය.